සියලුම හිමිකම් ඇවිරිණි]
All Right Reserved]

2016/A/L

24/02/2016

දැ මැසනොද් විදුහල, කඳාන
De Mazonod Collage, Kandana

ආර්ථික විද්‍යාව
Economics

13 ශ්‍රේණිය
Grade 13

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
General Certificate of Education (Advanced Level) Examination,

කාලය
පැය 02

Learning Resource Center
R
De Mazenod College
Kandana

❖ වඩාත්ම නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. පහත සඳහන් ප්‍රකාශන අතුරෙන් සූක්ෂම ආර්ථික විද්‍යාත්මක ප්‍රකාශනයක් වනුයේ කවරක්ද ?

(i) පසුගිය වසරේ දී රබර් මිල 10% කින් පහළ වැටුණි

(ii) පසුගිය වසරේ දී විරැකියාව ශ්‍රම හමුදාවෙන් 5.8% ක් වූයේය.

(iii) පසුගිය වසරේ දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 7% කින් ඉහළ ගියේය.

(iv) පසුගිය වසරේ දී පොදු මිල මට්ටම 4% කින් වැඩි විය

(v) පසුගිය වසරේ දී රජයේ බදු අයභාරය 8% කින් අඩු විය.

02. ආර්ථික පද්ධතියක් තුළ තීරණ ගනු ලබන ප්‍රධාන කණ්ඩායම් තුන වනුයේ,

(i) කුටුම්බ, ව්‍යාපාරික ආයතන සහ බැංකු වේ

(ii) කුටුම්බ, ව්‍යාපාරික ආයතන සහ රජය වේ.

(iii) ව්‍යාපාරික ආයතන, රජය සහ රාජ්‍ය නොවන සංවිධාන වේ.

(iv) ව්‍යාපාරික අයාතන, බැංකු සහ විදේශ වෙළඳාමේ නිරත වූවන් වේ

(v) කුටුම්බ, රජය සහ බැංකු වේ.

03. කිසියම් කටයුත්තක ආවස්ථික පිරිවැය

(i) එබඳු කටයුතු කරන සියල්ලන්ටම එක සමාන වේ.

(ii) ගණනය කිරීමේදී මුල්‍ය පිරිවැය සහ කැප කරන ලද ආදායම් යන දෙකොටසම ඇතුළත් කරගනී.

(iii) එම කටයුත්තෙහි මුල්‍ය පිරිවැය පමණක් ඇතුළත් කර ගනී.

(iv) එම කටයුත්ත නිසා කැප කරන්නට සිදුවූ ආදායම් පමණක් ඇතුළත් කර ගනී.

(v) එම කටයුත්ත නිසා හට ගන්නා සෘජු ප්‍රතිලාභ පමණක් මිනුම් කරයි.

04. කිසියම් රටක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත

(i) තාක්ෂණය වෙනස් වෙමින් පවතී.

(ii) අනික් භාණ්ඩයේ නිෂ්පාදනය අඩු නොකට, කිසියම් භාණ්ඩයක් වැඩිපුර නිපදවිය හැකිය

(iii) නිෂ්පාදන සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය නොවේ

(iv) පවත්නා සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය වේ.

(v) ආර්ථිකයේ නිෂ්පාදන අකාර්යක්ෂමතාවක් පවතී.

05. සෑම ආර්ථික කටයුත්තකදීම නිෂ්පාදන සම්පත් එකිනෙකට පූර්ණ ආදේශක වේ නම්, පහත සඳහන් දෑ අතුරෙන් කවරක් නිවැරදි වේද ?

(i) සියළුම භාණ්ඩවල නිමැවුම වැඩි කළ හැකිය

(ii) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය සරල රේඛාවක් වනු ඇත.

(iii) විශේෂ ප්‍රාගුණ්‍යතය සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වෙළඳාමක් හට ගැනීමට ඉඩක් නොපවතී.

(iv) කිසිදු රටක් හෝ කිසිදු පුද්ගලයෙක් හෝ කිසිදු කටයුත්තක් සම්බන්ධයෙන් සාපේක්ෂ වාසි අත්කර ගැනීමට අසමත් වේ.

(v) නිෂ්පාදන සම්පත් හිඟය අහෝසි වී යනු ඇත.

06. ධනවාදය පදනම් කරගත් ආර්ථිකයක පහත දක්වෙන එක් කරුණක් හැර අන් සියල්ල දක්නට ලැබේ. එලෙස දක්නට නොලැබෙන කරුණ වනුයේ,

(i) ඉල්ලුම හා සැපයුම මත පදනම් වූ මිල ක්‍රමයයි.

(ii) පෞද්ගලික දේපළ ක්‍රමයයි

(iii) ස්වාර්ථය මත කටයුතු කරන කුටුම්බ සහ ව්‍යවසායකයන්ය

(iv) ව්‍යවසායක නිදහසයි

(v) මධ්‍යගත සැලසුම්කරණයයි.

07. ආර්ථිකය තුළ ආණ්ඩුවේ සහභාගිත්වය වඩාත් ප්‍රබල ලෙස දක්නට ලැබෙන්නේ,

(i) වෙළඳපොළ ආර්ථිකයකය

(ii) විධානගත ආර්ථිකයකය

(iii) මිශ්‍ර ආර්ථිකයකය

(iv) සමාජ වෙළඳපොළ ආර්ථිකයකය

(v) සාම්ප්‍රදායික ආර්ථිකයක

08. කිසියම් පුද්ගලයෙක් ආදායම ඉහළ යන විට කිරි පිටි සඳහා කරන ඉල්ලුම වැඩි කරයි නම්, කිරිපිටි

(i) බාල භාණ්ඩයකට උදාහරණයක් වේ

(ii) ආර්ථික නොවන භාණ්ඩයකට උදාහරණයක් වේ.

(iii) ගිෆන් භාණ්ඩයකට උදාහරණයක් වේ

(iv) පොදු භාණ්ඩයකට උදාහරණයක් වේ.

(v) සාමාන්‍ය භාණ්ඩයකට උදාහරණයක් වේ.

09. යම් දෙන ලද අවස්ථාවක තරගකාරී වෙළඳපොළක "සාමාන්‍ය භාණ්ඩයක් සඳහා ඉල්ලුම වැඩි වී සැපුයම් අඩු වුවහොත්,

(i) සමතුලිත මිල පහළ වැටෙන අතර සමතුලිත ප්‍රමාණය ඉහළ නගී

(ii) සමතුලිත මිලත් ප්‍රමාණයත් දෙකම ඉහළ නගී

(iii) සමතුලිත ප්‍රමාණය ඉහළ නගී. සමතුලිත මිල ඉහළ යාමට හෝ පහළ යාමට හෝ පිළිවන

(iv) සමතුලිත මිල පහළ බසී. සමතුලිත ප්‍රමාණය ඉහළ යාමට හෝ පහළ යාමට හො පිළිවන

(v) සමතුලිත මිල ඉහළ නගී. සමතුලිත ප්‍රමාණය ඉහළ යාමට හෝ පහළ යාමට හෝ නොවෙනස්ව තිබීමට හෝ පිළිවන

13 ශ්‍රේණිය
ආර්ථික විද්‍යාව

10. බොහෝ පරිභෝජන කටයුතු වලදී සීනි සහ හකුරු එකිනෙකට ආදේශක වශයෙන් සැලැකේ. එබැවින් සීනි මිල ඉහළ ගියහොත්,

(i) හකුරු ඉල්ලුම වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ
(ii) හකුරු ඉල්ලුම අඩු වෙතැයි අපේක්ෂා කෙරේ
(iii) හකුරු ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු වෙතැයි අපේක්ෂා කෙරේ.
(iv) හකුරු මිල අඩු වෙතකැයි අපේක්ෂා කෙරේ
(v) හකුරු ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වෙතැයි අපෙක්ෂා කෙරේ.

11. පොල් සඳහා මිල ඉල්ලුම් නම්‍යතාවය -1.0 ක් වේ යැයි සලකන්න. එම තත්ත්වය යටතේ පොල් ගෙඩියක මිල රු 60ක් වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය පොල් ගෙඩි 500 ක් වේ. ඉල්ලුම් කරනු ලබන පොල් ගෙඩි ප්‍රමාණය 600 වනුයේ, පොල් ගෙඩියක මිල කොපමණ වන විටදීද ?

(i) රු 30 (ii) රු 40 (iii) රු 50 (iv) රු 55 (v) රු 60

12. කිසියම් භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් වක්‍රය වමට විතැන් වීමට බලපානුයේ පහත සඳහන් කවර සාධකයක්ද ?

(i) එම භාණ්ඩයේ මිල ඉහළ යාම
(ii) එම භාණ්ඩයේ මිල පහළ වැඩීම
(iii) අනුපූරක භාණ්ඩයක මිල පහළ වැටීම
(iv) ආදේශක භාණ්ඩයක මිල ඉහළ යාම
(v) අනාගත මිල පහළ වැටෙතියි යන අපේක්ෂාව

13. පහළට බෑවුම් වන වෙළඳපොළ ඉල්ලුම් වක්‍රයක් සහ ඉහළට බෑවුම් වන වෙළඳපොළ සැපයුම් වක්‍රයක් සහිත භාණ්ඩයක යෙදවුම් මිල පහළ වැටීමේ ප්‍රතිඵලයක් වනුයේ,

(i) සමතුලිත මිල හා ප්‍රමාණය ඉහළ යාමය
(ii) සමතුලිත මිල හා ප්‍රමාණය පහළ යාමය
(iii) සැපයුම් වක්‍රය වමට විතැන් වීමය
(iv) සමතුලිත මිල පහළ වැටීම හා සමතුලිත ප්‍රමාණය ඉහළ යාමය
(v) සමතුලිත මිල ඉහළ යාම හා සමතුලිත ප්‍රමාණය පහළ යාමය.

14. කිසියම් කුඩා රටක සීනි සඳහා දේශීය වෙළඳපොළේ පවත්නා ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පිළිවෙලින් පහත සඳහන් සමීකරණ පෙන්නුම් කරයි.

$Q_d = 320 - 3p$ (ඉල්ලුම) $Q_s = -80 + 2P$ (ඉල්ලුම)

තවද එම රටේ සීනි වෙළඳපොළ ජාත්‍යන්තර වෙළඳාමට විවෘත බවත්, සීනි ඒකකයක ලෝක වෙළඳ පොළ මිල රු 60ක් බව සිත්නන. සපයනු ලබන සීනි ප්‍රමාණය කොපමණ වේද ?

(i) ඒකක 40 (ii) ඒකක 60 (iii) ඒකක 80
(iv) ඒකක 100 (v) ඒකක 140

15. පෙට්‍රල් සඳහා පවත්නා ඉල්ලුම අතිශයින් අනම්‍ය බවත් එහි සැපයුම අතිශයින් නම්‍ය බවත් සලකන්න. මෙම තත්ත්වය යටතේ පෙට්‍රල් මත නිෂ්පාදන බද්දක් පනවනු ලැබුවහොත් බදු බර

(i) ඉතා විශාල වශයෙන් ගැනුම්කරුවන් විසින් කරනු ලැබේ.


(ii) ඉතා විශාල වශයෙන් විකුණුම් විසින් දරනු ලැබේ

(iii) ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් විසින් සමසමව දරනු ලැබේ.

(iv) මුළුමනින්ම අය බදු ගෙවන්නෝ දරති

(v) ගැනුම්කරුවෝ හෝ විකුණුම්කරුවෝ හෝ නොදරති.

16. කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා පවත්නා තරගකාරී වෙළෙඳපොළක ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර මෙම ප්‍රස්තාර සටහන පෙන්නුම් කරයි.




(i) රු 20 කි (ii) රු 80 කි (iii) රු 90 කි (iv) රු 160 කි (v) රු 180 කි

17. සමතුලිත මිලට වඩා පහළ මිලක් නියම කරමින් පනවනු ලබන උපරිම මිල ප්‍රතිපත්තියක ප්‍රතිඵලයක් වනුයේ වෙළෙඳපොළෙහි,

(i) අධි සැපයුමක් හට ගැනීමය (iii) සමතුලිත මිලක් ඇති වීමය

(ii) අධි ඉල්ලුමක් හට ගැනීමය (iv) සැපයුම වැඩි වීමය

(v) ඉල්ලුම අඩු වීමය

18. නිෂ්පාදන ක්‍රියාවලියේදී කෙටි කාලය ලෙස සැලකෙන කාල පරිච්ඡේදයේදී,

(i) වැඩිපුර කම්කරුවන් සේවයට යොදා ගැනීමට ආයතනයට නොහැකි වේ

(ii) නිෂ්පාදනය කරනු ලබන නිමැවුම් ප්‍රමාණය නොවෙනස්ව පවතී

(iii) බොහෝ යෙදවුම් වල හිඟයක් හටගනී

(iv) සියලුම යෙදවුම් ස්ථාවරව පැවතියත් නිමැවුම වෙනස් කළ හැකිය

(v) සමහර යෙදවුම් ප්‍රමාණ නොවෙනස්ව පවත්නා අතර සමහර යෙදවුම් ප්‍රමාණ වෙනස් කළ හැකිය

19. මුළු පිරිවැය (TC) සහ මුළු විචල්‍ය පිරිවැය (TVC) වක්‍ර අතර පවතින සිරස් දුර,

(i) නිමැවුම අඩුවන විට අඩු වෙමින් පවතී (iii) ආන්තික පිරිවැයට (MC) සමාන වේ

(ii) නිමැවුම අඩුවන විට වැඩි වෙමින් පවතී (iv) මුළු ස්ථාවර පිරිවැයට (TFC) සමාන වේ

(v) සාමාන්‍ය ස්ථාවර පිරිවැයට (AFC) සමාන වේ

39. ශුද්ධ පොදු භාණ්ඩයක් යනු,

(i) වෙළෙඳපොළ විසින් කාර්යක්ෂමව සපයනු ලබන භාණ්ඩයකි

(ii) පරිභෝජනයේ තරඟකාරිත්වයක් පවතින සහ පරිභෝජනය වැළැක්විය හැකි භාණ්ඩයකි

(iii) පරිභෝජනයේ තරඟකාරිත්වයක් නොමැති සහ පරිභෝජනය වැළැක්විය හැකි භාණ්ඩයකි

(iv) පරිභෝජනයේ තරඟකාරිත්වයක් පවතින සහ පරිභෝජනය වැළැක්විය නොහැකි භාණ්ඩයකි

(v) පරිභෝජනයේ තරඟකාරිත්වයක් නොමැති සහ පරිභෝජනය වැළැක්විය නොහැකි භාණ්ඩයකි

40. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යටතේ රජය,

(i) වෙළෙඳපොළ පොලී අනුපාතිකය තීරණය කරයි

(ii) මුදල් සැපයුමේ වර්ධන අනුපාතිකය තීරණය කරයි

(iii) බදු අය කිරීම හා ආණ්ඩුවේ වියදම් මට්ටම තීරණය කරයි

(iv) මුදල් සැපයුම තීරණය කරයි

(v) උද්ධමන අනුපාතිකය තීරණය කරයි

41. වර්තමානයේ ශ්‍රී ලංකා රජයේ විශාලතම බදු අයභාර මූලාශ්‍රය වනුයේ,

(i) එකතු කළ අගය මත අය කරන බද්ද ය

(ii) සමාගම් ආදායම් බද්ද ය

(iii) නිෂ්පාදන බද්දය

(iv) ආනයන බද්දය

(v) උපයන විට ගෙවීමේ බද්ද ය (PAYE)

42. පහත සඳහන් කරුණු අතුරෙන් රටවල් අතර සාපේක්ෂ වාසි තීරණය කෙරෙන ප්‍රධාන නිශ්චායකයක් ලෙස ඇතුළත් නොවනුයේ,

(i) ඒක පුද්ගල ආදායම ය

(ii) දේශගුණය

(iii) ශ්‍රම හමුදාවේ නිපුණතාවයන්

(iv) එක් ශ්‍රමිකයෙකුට වැටෙන ප්‍රාග්ධනයේ ප්‍රමාණය

(v) භූගෝලීය පිහිටීමය

43. A හා B යන රටවල සංයුක්ත සම්පත් ඒකකයක් යොදා ගනිමින් නිපදවිය හැකි පාපැදි හා ට්‍රැක්ටර් ප්‍රමාණ පහත වගුවෙහි දැක්වේ.

| භාණ්ඩය | A රට | B රට |
|---|---|---|
| ට්‍රැක්ටර් | 20 | 2 |
| පාපැදි | 60 | 10 |

එක් එක් රට තමන්ට සාපේක්ෂ වාසි සහිත භාණ්ඩය විශේෂ ප්‍රාගුණ්‍යතය කරතියි උපකල්පනය කරන්න. මෙහිදී අන්‍යෝන්‍යය වශයෙන් වාසිදායක වෙළෙඳාමක් හට ගැනීම සඳහා ට්‍රැක්ටර් සහ පාපැදි හුවමාරු විය යුතු අනුපාතය වනුයේ,

(i) එක් ට්‍රැක්ටරයක් සඳහා පාපැදි 3 කට අඩු ප්‍රමාණයකි

(ii) එක් ට්‍රැක්ටරයක් සඳහා පාපැදි 3 සහ 5 තුර ප්‍රමාණයකි

(iii) එක් ට්‍රැක්ටරයක් සඳහා පාපැදි 2 සහ 60 අතර ප්‍රමාණයකි

(iv) එක් ට්‍රැක්ටරයක් සඳහා පාපැදි 6 සහ 10 අතර ප්‍රමාණයකි

(v) එක් ට්‍රැක්ටරයක් සඳහා පාපැදි 10 කට වැඩි ප්‍රමාණයකි

44. මහ බැංකුව විසින් විවෘත වෙළඳපොළෙහි ආණ්ඩුවේ සුරැකුම්පත් මිලදී ගනු ලැබුව හොත්

(i) බැංකුවල සංචිත වැඩි වන අතර, පදනම් මුදල් ප්‍රමාණයද වැඩි වේ.

(ii) බැංකුවල සංචිතය අඩු වන අතර, පදනම් මුදල් ප්‍රමාණය අඩු වේ.

(iii) බැංකුවල සංචිතය වැඩි වන අතර, පදනම් මුදල් ප්‍රමාණය අඩු වේ.

(iv) බැංකුවල සංචිත අඩු වන අතර, පදනම් මුදල් ප්‍රමාණය වැඩි වේ.

(v) බැංකුවල සංචිත අඩුවන අතර, බැංකු සතුව අධි සංචිත පවතී නම් මුදල් සැපයුම වැඩි වනු ඇත.

45. වෙළඳපොළ අසාර්ථකත්වයක් නිවැරදි කිරීම සඳහා ආණ්ඩුවේ මැදිහත් වීමට හේතුවක් වනුයේ, පහත සඳහන් කවර කරුණක්ද ?

(i) බාල භාණ්ඩ (Inferior goods) තිබීම

(ii) පරිමාණානුකූල නොපිරිමැසුම් හට ගැනීම

(iii) නිෂ්පාදනයේ සහ පරිභෝජනයේ බාහිරතා හට ගැනීම

(iv) සමජාතීය භාණ්ඩ තිබීම

(v) ප්‍රචාරණය සිදුවීම

46. ගල් අඟුරු බලාගාරයේ ඉදිකිරීම නිසා හට ගන්නා පෞද්ගලික හා බාහිර පිරිවැයත්, පෞද්ගලික හා බාහිර ප්‍රතිලාභත් පහත සඳහන් වගුව පෙන්නුම් කරයි.

| (සංඛ්‍යා රුපියල් බිලියන වලින්) | |
|---|---|
| පෞද්ගලික ප්‍රතිලාභ | 180 |
| පෞද්ගලික පිරිවැය | 190 |
| බාහිර ප්‍රතිලාභ | 110 |
| බාහිර පිරිවැය | 140 |

මෙම දත්තවලට අනුව, සමාජ පිරිවැය හා සමාජ ප්‍රතිලාභ අතර වෙනස වනුයේ,

(i) රුපියල් බිලියන 120 කි (iv) රුපියල් බිලියන 30 කි

(ii) රුපියල් බිලියන 50 කි (v) රුපියල් බිලියන 10 කි

(iii) රුපියල් බිලියන 40 කි

47. නිදහස් වෙළඳපොළ ආර්ථිකයක්, හිඟ සම්පත් ප්‍රශස්ත ලෙස බෙදා වෙන් කිරීමේ ලා අසාර්ථක වීමට බලපාන එක් හේතුවක් වනුයේ,

(i) පොදු භාණ්ඩ මිලක් අය නොකොට ඒවා භාවිත කරන අයට ලබා දීමය.

(ii) ධන බාහිරතා නිසා ඇතැම් භාණ්ඩ වල අධි නිෂ්පාදනයක් සිදුවීමය

(iii) ධන බාහිරතා ඇති භාණ්ඩවල ඌන නිෂ්පාදනයක් සිදුවීමය

(iv) සෑම පුද්ගලයෙකුගේම ආදායම හා ධනය එක සමාන නොවීමය

(v) තරගය පැවැතීමය.

48. උග්‍ර පසුබෑමකට මුහුණ පා සිටින ආර්ථිකයක, නිෂ්පාදනය උත්තේජනය කිරීමේ ලා වඩාත් සඵල රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය වනුයේ,

(i) ආණ්ඩුවේ වියදම් වැඩි කිරීමය
(ii) ආණ්ඩුවේ වියදම් අඩු කිරීමය
(iii) පෞද්ගලික ආදායම් බදු ඉහළ නැංවීමය
(iv) මහ බැංකුව විසින් විවෘත වෙළඳපොළෙහි සුරැකුම්පත් අලෙවි කිරීමය
(v) මහ බැංකුව විසින් විවෘත වෙළඳපොළෙහි සුරැකුම්පත් මිලදී ගැනීමය.

49. X හා Y යන රටවල ආහාර ඒකකයක් හා රෙදි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය කෙරෙන ශ්‍රම පැය සංඛ්‍යාවන් පහත වගුවේ දැක්වේ.

| රට | ආහාර | රෙදි |
|---|---|---|
| X | පැය 20 | පැය 50 |
| Y | පැය 10 | පැය 20 |

මෙම තොරතුරු වලට අනුව වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ කවරක්ද ?

(i) ආහාර සහ රෙදි යන භාණ්ඩ දෙකම නිපදවීමෙහි ලා සාපේක්ෂ වාසි x රටට තිබේ.
(ii) ආහාර සහ රෙදි යන භාණ්ඩ දෙකම නිපදවීමෙහි ලා සාපේක්ෂ වාසි y රටට තිබේ.
(iii) ආහාර නිෂ්පාදනයෙහි ලා සාපේක්ෂ වාසිය X රටට ඇති අතර, රෙදි නිෂ්පාදනයෙහි ලා සාපේක්ෂ වාසිය Y රටට ඇත.
(iv) ආහාර නිෂ්පාදනයෙහි ලා සාපේක්ෂ වාසිය Y රටට ඇති අතර, රෙදි නිෂ්පාදනයෙහි ලා සාපේක්ෂ වාසිය X රටට ඇත.
(v) කවර භාණ්ඩයක්වත් නිෂ්පාදනය කිරීමෙහි ලා සාපේක්ෂ වාසියක් කිසිදු රටක නොමැත.

50. ආර්ථික වෘද්ධිය සාමාන්‍යයෙන් මනිනු ලබනුයේ පහත සඳහන් විචල්‍යයක වාර්ෂික වෙනස්වීම් ඇසුරෙනි. එම විචල්‍යය වනුයේ,

(i) පාරිභෝගික මිල දර්ශකය
(ii) මූර්ත දළ ජාතික නිෂ්පාදිතය
(iii) නිෂ්පාදන කර්මාන්ත අංශයේ නිමැවුම
(iv) පරිභෝජන වියදම
(v) ආයෝජන අනුපාතිකය

සියලුම හිමිකම් ඇවිරිණි]
All Right Reserved]

Learning Resource Center
R
De Mazenod College
Kandana

24/02/2016
2016 A/L.

| | | |
|---|---|---|
| ද මැසනොද් විදුහල, කඳාන<br>De Mazonod Collage, Kandana | ආර්ථික විද්‍යාව<br>*Economics* | 13 ශ්‍රේණිය<br>*Grade 13* |
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය<br>**General Certificate of Education (Advanced Level) Examination,** | | කාලය<br>පැය 03 |

**"අ" උප කොටසින් ප්‍රශ්න දෙකක්ද, "ආ" උප කොටසින් ප්‍රශ්න දෙකක්ද, අවම වශයෙන් ඇතුලත් වන පරිදි ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

## "අ" කොටස

(01) (i) ප්‍රාග්ධනය හා මානව ප්‍රාග්ධනය අතර වෙනස කුමක්ද ? (ලකුණු 04)

(ii) විශේෂීකරණය හා ශ්‍රම විභජනය නගාලීම සඳහා මුදල් උපකාරී වන්නේ කුමන ආකාරයෙන්ද? (ලකුණු 04)

(iii) හිඟකම පිළිබඳ ගැටලුවට මුහුණ දෙමින් ආර්ථිකය මෙහෙයවීමේදී වෙළඳපොළ ආර්ථික පද්ධතිය හා විධානගත ආර්ථික පද්ධතියක් එකිනෙකින් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) ආර්ථිකයේ සම්පත් කාර්යක්ෂමව උපයෝජනය වේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි කවරේද ? (ලකුණු 04)

(v) ආර්ථිකයේ සූක්ෂම හා සාර්ව ආර්ථික ගැටලු පැහැදිලි කිරීම සඳහා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය යොදා ගත හැක්කේ කෙසේද ? (ලකුණු 04)

(02) (i) වෙළඳපොළ සැපයුම් වක්‍රයක් ඇඳීමේදී ස්ථාවරව පවතිතැයි සලකනු ලබන සාධක කවරේද ? (ලකුණු 04)

(ii) ආදායම් හා ආදේශන ප්‍රතිවිපාක විසින් ඉල්ලුම් නීතිය පැහැදිලි කරනු ලබන්නේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 04)

(iii) අවම මිලක් සහ උපරිම මිලක් අතර වෙනස උදාහරණය බැගින් දක්වමින් පෙන්වා දෙන්න. (ලකුණු 04)

(iv) සැපයුමේ අනම්‍යතාවක් පවතින භාණ්ඩයක නිෂ්පාදකයින් මත විශේෂිත (ඒකක) බද්දක් පනවනු ලැබුවහොත් බදු බරින් වැඩි කොටසක් දරනු ලබන්නේ කවුරුන් විසින්ද ? යෝග්‍ය ප්‍රස්තාර සටහනක් යොදා ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) කිසියම් භාණ්ඩයක් සඳහා පවත්නා වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිතවලට අදාළ සමීකරණය පහත දක්වේ.

$Qd = 100 - 4P$ (ඉල්ලුම) $Qs = -30 + 6P$ (සැපයුම)

(අ) සමීකරණ යොදා ගනිමින් සමතුලිත මිල සහ ප්‍රමාණය ගණනය කොට එම සමතුලිතය ප්‍රස්තාර සටහනක නිවැරදිව පෙන්නුම් කරන්න. (ලකුණු 02)

(ආ) වෙළඳපොළ සමතුලිත අවස්ථාවේදී නිෂ්පාදක අතිරික්තය හා පාරිභෝගික අතිරික්තය ගණනය කොට ප්‍රස්තාර සටහන ඒවා පෙන්නුම් කරන්න. (ලකුණු 02)

(03) (i) නිෂ්පාදන ක්‍රියාවලියේදී කෙටි කාලය හා දිගු කාලය අතර වෙනස දක්වන්න. (ලකුණු 02)

(ii) "හීනවන ඵල නීතිය" පැහැදිලි කරන්න. (ලකුණු 02)

(iii) ඍජු පිරිවැය සහ ආරෝපිත පිරිවැය අතර වෙනස උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) පරිමාණුකූල පිරිමැසුම් යනු කවරේද? ඒවා හට ගන්නේ කෙසේද ? (ලකුණු 06)

(v) වෙළඳපොළ ව්‍යුහයන්ගේ ස්වරූප හතරෙ කවරේද ? ඉන් එක් වෙළඳපොළ ව්‍යුහයක කැපී පෙනෙන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04) (i) විවෘත ආර්ථිකයක සමාහාර වියදමෙහි සංරචක කවරේද ? ඒ එක් එක් සංරචකය නිර්වචනය කරන්න. (ලකුණු 06)

(ii) ඉතුරුම් ශ්‍රිතය සහ පරිභෝජන ශ්‍රිතය අතර පවතින සම්බන්ධය කුමක්ද ? (ලකුණු 02)

(iii) ආණ්ඩුවේ ආර්ථික කටයුතු නොමැති ආවෘත ආර්ථික ක්‍රමයක පරිභෝජන ශ්‍රිතය, $C = 100 + 0.8y$, ලෙසත් ආයෝජන $I = 50$ ක් ලෙසත් සලකන්න.

(අ) මෙම ආර්ථිකයේ සමතුලිත ආදායම කොපමණද ? (ලකුණු 02)

(ආ) සමතුලිත අවස්ථාවේදී ආර්ථිකයේ ඉතුරුම් මට්ටම කොපමණද ? (ලකුණු 02)

(ඇ) සමාහාර ඉල්ලුම නොවෙනස්ව තිබියදීම, කිසියම් හේතුවක් නිසා ආර්ථිකයේ නිමැවුම් මට්ටම (ආදායම) 800 ක් වුවහොත්, අනපේක්ෂිත තොග සමුච්චනය කොපමණ වේද ? (ලකුණු 02)

(ඈ) ආයෝජනය (I) 100 දක්වා වැඩිවුවහොත්, සමතුලිත ආදායම් මට්ටම කෙරෙහි ඇතිවන බලපෑම කවරේද ? (ලකුණු 02)

(ඉ) (අ) සහ (ඈ) යන අවස්ථා දෙකේදී දක්නට ලැබෙන සමතුලිත තත්වයන් රූප සටහනක් මගින් පෙන්වන්න. (ලකුණු 04)

(05) (i) කිසියම් රටක සමස්ත ආර්ථික ක්‍රියාවලිය මිනුම් කිරීම සඳහා භාවිත කෙරෙන ප්‍රවේශ තුන කවරේද ? එම ප්‍රවේශ තුනම සමස්ත ආර්ථික ක්‍රියාවලිය පිළිබඳ එකම අගයක් ලබා දෙන්නේ ඇයි ? (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ ජාතික ඉතුරුම්වල ප්‍රධාන මූලාශ්‍ර කවරේද ? (ලකුණු 04)

(iii) ජාතික ආදායම් සංඛ්‍යා ලේඛන ප්‍රයෝජනවත් වන්නේ කවර ආකාරයන්ගෙන්ද ? (ලකුණු 04)

(iv) එක්තරා කල්පිත ආර්ථිකයක් පිළිබඳ පහත සඳහන් දත්ත ඔබ වෙත දී ඇතැයි සලකන්න (සියලු සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)

| අයිතම | වටිනාකම | අයිතම | වටිනාකම |
|---|---|---|---|
| දළ දේශීය පෞද්ගලික ආයෝජනය | 70 | ආණ්ඩුවෙන් කුටුම්බ වෙත ලබා දෙන සංක්‍රාම | 25 |
| ආණ්ඩුවේ මිලදී ගැනීම් | 50 | ආණ්ඩුවෙන් කුටුම්බ වෙත කරනු ලබන පොලී ගෙවීම් | 15 |
| වෙළඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය | 400 | විදේශ වලින් ලැබෙන සාධක ආදායම් | 07 |
| ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමේ ශේෂය | -25 | සාධක ආදායම් ගෙවීම් | 12 |
| බදු | 100 | ශුද්ධ විදේශ වර්තන සංක්‍රාම | 10 |

ඉහත තොරතුරු ආශ්‍රයෙන් පහත සඳහන් දෑ ගණනය කරන්න.

අ) ශුද්ධ ආපනයන (ලකුණු 02)

ආ) පෞද්ගලික පරිභෝජන වියදම (ලකුණු 02)

ඉ) වැය කළ හැකි දළ ජාතික ආදායම (ලකුණු 02)

ඊ) ආණ්ඩුවේ ඉතුරුම් (ලකුණු 02)

"ආ" කොටස

(06) (i) "මුදල් නිර්වචනය කොට, භාණ්ඩ හුවමාරු (බාටර්) ක්‍රමයක දක්නට ලැබුණු දුෂ්කරතා ඉවත් කරලීමට මුදල් සමත් වී ඇත්තේ කෙසේදැයි සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 04)

(ii) ණයපත් මුදල් නොවන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) ආර්ථිකයක මුදලට ඇති ඉල්ලුම තීරණය කරන සාර්ව ආර්ථික විචල්‍යයන් නම් කොට, එම විචල්‍යයන් මුදල් ඉල්ලුම කෙරෙහි බලපාන්නේ කෙසේදැයි සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය සහ පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමනය අතර වෙනස ඔබ පෙන්වා දෙන්නේ කෙසේද ? යෝග්‍ය ප්‍රස්තාර සටහන් භාවිත කරමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(v) වර්තමානයේ ශ්‍රී ලංකාවේ දේශීය මුදල් වෙළඳපොළෙහි ඉතා ඉහළ මට්ටමේ අධි ද්‍රවශීලතාවයක ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද ? (ලකුණු 04)

(07) (i) පහත දැක්වෙන භාණ්ඩ හා සේවාවන් නිර්වචනය කොට ඒවාට උදාහරණ බැගින් සපයන්න.

(අ) පොදු භාණ්ඩ

(ආ) පොදු සම්පත්

(ඇ) අර්ධ පොදු භාණ්ඩ (ලකුණු 06)

(ii) ව්‍යවස්ථාපිත බදු ආපාතය සහ ආර්ථික බදු ආපාතය අතර වෙනස දක්වන්න. (ලකුණු 04)

(iii) බදු ක්‍රමයේ මධ්‍යස්ථභාවය (Neutrality) යන්නෙන් අදහස් වන්නේ කුමක්ද ? (ලකුණු 02)

(iv) අයවැය ලේඛනයේ "ප්‍රාථමික හිඟය" සහ "වර්තන හිඟය" යන සංකල්පය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) ශ්‍රී ලංකා රජයේ බදු නොවන ප්‍රධාන අයභාර මූලාශ්‍ර සඳහන් කරන්න. (ලකුණු 04)

(08) (i) ආර්ථික රජයේ කාර්යභාරය කවරේද ? (ලකුණු 04)

(ii) ආර්ථිකයක් තුල සාධාරණවත්යක් ඇති කිරීම සඳහා රජයට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද ? (ලකුණු 04)

(iii) "වෙළඳ පොළ අසමත් වීම" ලෙස කුමක් අදහස් වේද ? කුමන අවස්ථාවලදී වෙළඳපොළ අසමත් වීමත් සිදුවිය හැකිද ? (ලකුණු 04)

(iv) පෞද්ගලික පිරිවැය සහ සමාජ පිරිවැය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) නිෂ්පාදනයේ සෘණ බාහිරතාවයක් පවතින විට වෙළඳපොළ නිමැවුම හා සාමාජීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම අතර වෙනස යෝග්‍ය රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(09) (i) නිරපේක්ෂ වාසි සහා සාපේක්ෂ වාසි අතර වෙනස පහදන්න. (ලකුණු 04)

(ii) සාපේක්ෂ වාසි හටගැනිමට බලපාන සාධක මොනවාද ? (ලකුණු 04)

(iii) රටක් විදේශ වෙළඳාමට විවෘත වීමෙන් අත්වන වාසි මොනවාද ? (ලකුණු 04)

(iv) විදේශ වෙළඳාම පිළිබඳ දත්ත පහත දැක්වේ. (ලකුණු 04)

**ශ්‍රම පැයක නිමැවුම**

| රට / භාණ්ඩය | ජිශ්‍රායලය | රුසියාව |
|---|---|---|
| ගුවන් යානා | 0.2 | 0.4 |
| මිසයිල | 0.8 | 0.6 |

(අ) ගුවන් යානා හා මිසයිල සඳහා නිරපේක්ෂ වාසි ඇති රටවල් මොනවාද ? (ලකුණු 02)

(ආ) එක් එක් රටෙහි එක් එක් භාණ්ඩයේ ආවස්ථික පිරිවැය වෙන වෙනම සොයන්න. (ලකුණු 02)

(ඇ) ගුවන් යානා සහ මිසයිල සඳහා සාපේක්ෂ වාසි ඇති රටවල් මොනවාද ? (ලකුණු 02)

(ආ) රුසියාව හා ඊශ්‍රායලය විශේෂ ප්‍රාගුණ්‍ය කල යුත්තේ කුමන භාණ්ඩයන්ද ? (ලකුණු 02)

(10) (i) ආර්ථික වෘද්ධිය යනුවෙන් කුමක් අදහස් වේද ? (ලකුණු 04)

(ii) ආර්ථික වෘද්ධිය සඳහා රජය මැදිහත් විය හැක්කේ කෙසේද ? (ලකුණු 04)

(iii) මෑත වර්ෂ වල ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය කවරේද ? (ලකුණු 05)

(iv) ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීමේදී සේවා අංශයට ඇතුලත් කරන ප්‍රධාන ආර්ථික කටයුතු මොනවාද ? (ලකුණු 07)